# ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය

## ධීවර කර්මාන්ත ක්ෂේත්‍රයේ නව දේශීය ව්‍යවසායකයින් සඳහා අවස්ථාව ලබාදීම

# ශ්‍රී ලාංකික පුරවැසි ආයෝජකයින් සහ දේශීය සමාගම් වෙත කරනු ලබන ආරාධනයයි.

i. අපනයනය ඉලක්ක කරගත් ගුණාත්මකභාවයෙන් යුතු ටූනා මසුන් (Yellow fin / Big Eye) ජාත්‍යන්තර මුහුදෙන් අල්ලා අධිශීතකර (Frozen/ Super Frozen Fish) ගොඩබිමට රැගෙන ඒමේ හැකියාව සහිත විදේශයන්හි හෝ දේශීයව නිෂ්පාදිත නවීන තාක්ෂණික පහසුකම් සහිත මීටර් විසි හතරට වඩා දිගින් වැඩි (>24 m) ලෝහමය බඳ සහිත මරුවැල්පන්න ධීවර යාත්‍රා (Metal hulled Long liners) සඳහා දේශීය ආයෝජකයින් වෙත ධීවර මෙහෙයුම් කිරීමේ බලපත්‍ර සීමිත ප්‍රමාණයක් (Fishing Operations License for Tuna Long line) ලබාදීමට ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය තීරණය කොට ඇත.

ii. තවද බහුදින යාත්‍රා මගින් අල්ලාගනු ලබන ලින්නා මසුන්, දේශීය මුහුදු සීමාවේදී එකතු කර ගොඩබිමට රැගෙන ඒමේ හැකියාව සහිත විදේශීයන්හි හෝ දේශීයව නිෂ්පාදිත නවීන තාක්ෂණික පහසුකම් සහිත මීටර් විසි හතරට වඩා දිගින් වැඩි (>24 m) ලෝහමය බඳ සහිත මසුන් එකතු කිරීමේ යාත්‍රා සඳහා (Collecting Vessels) ද දේශීය ආයෝජකයින් වෙත ධීවර මෙහෙයුම් කිරීමේ බලපත්‍ර (Operation License for Collecting Vessels) සීමිත ප්‍රමාණයක් ලබාදීමට තීරණය කර ඇත.

මේ පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශ්වයන් සිටී නම්, තොරතුරු ඇතුළත් ව්‍යාපෘති වාර්තාවක් **"ලේකම්, ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය, මාළිගාවත්ත, කොළඹ-10"** ලිපිනයට 2025.10.31 දිනට පෙර යොමු කරන මෙන් හෝ ගෙනැවිත් භාරදෙන මෙන් මෙයින් දන්වා සිටිමි.

**ලේකම්,**
**ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය.**